DOI: https://doi.org/10.4038/jipe.v2i2.165

*REVIEW ARTICLE* *JIPE, 2026*

*Vol. 02, No. 02, (pp. 109-142)*

# Appropriate Educational Strategies for Generation Alpha: A Narrative Literature Review

N.R.T.N.K. Rathnayake* & C. Siriwardena

## Abstract

A paradigm shift in traditional educational methodologies is essential, as the 'Generation Alpha', known as 'digital natives', born after 2010, faces challenges such as short attention spans, lack of life skills, and mental fragility, despite its high digital literacy. The objectives of this research were to identify the psychosocial and digital behavioural patterns of the Generation Alpha, analyse the roles of Sri Lankan education stakeholders (teachers, parents, and administrators), investigate the attitudinal, skilled labour, and infrastructure challenges they face, and propose strategies to facilitate the learning needs of Generation Alpha students. A narrative literature review was conducted using international databases to collect primary data, which were synthesised through thematic analysis. Accordingly, teachers need to move away from traditional teaching and be trained to lead virtual classrooms and integrate technology into education, and it is essential to change their negative attitudes towards technology. Furthermore, school administration should adopt transformational leadership based on discussion and consensus instead of strict rules, and parents should support character development by carefully controlling their children's excessive digital use. Innovative learning methodologies, such as blended learning and gamification, should be incorporated together with social-emotional learning models to engage students and foster critical thinking, communication, collaboration, and creativity. Despite Sri Lanka's infrastructural limitations and economic constraints, by developing a flexible education roadmap that safeguards children's well-being, digital safety, and soft skills, Generation Alpha can be successfully prepared for the future world.

***Keywords:*** Generation Alpha, Education Stakeholders, Education Strategies, Digital Learning

**Contact:* tnkrat79@gmail.com
*ORCID:* https://orcid.org/0009-0004-6916-3868

*(Received 24 January 2026; Revised 20 July 2026; Accepted 27 July)* © OUSL

This article is published under the Creative Commons Attribution-Share Alike 4.0 International License (CC-BY-SA). This license permits use, distribution and reproduction in any medium; provided it is licensed under the same terms, and the original work is properly cited.

# ඇල්ෆා පරම්පරාව සඳහා උචිත අධ්‍යාපන ක්‍රමෝපායන් පිළිබඳ ආඛ්‍යාන සාහිත්‍ය විමර්ශනයක්


## සාරසංක්ෂේපය

වර්ෂ 2010න් පසු උපත ලැබූ, තාක්ෂණය තම ජීවන රටාව කරගත් 'ඩිජිටල් ස්වදේශිකයන්' (Digital Natives) ලෙස හැඳින්වෙන 'ඇල්ෆා පරම්පරාව' (Generation Alpha) සතු ඉහළ ඩිජිටල් සාක්ෂරතාවට සාපේක්ෂව කෙටි අවධානය, ජීවන කුසලතා හිඟකම සහ මානසික බිඳෙනසුලු බව වැනි අභියෝග රැසක් පවතින බැවින් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයන්හි සුසමාර්දර්ශී වෙනසක් අත්‍යවශ්‍ය වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ඇල්ෆා පරම්පරාවේ මනෝ-සමාජීය හා ඩිජිටල් චර්යා රටා හඳුනා ගැනීම, ශ්‍රී ලාංකීය අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ (ගුරු, දෙමාපිය, පරිපාලක) භූමිකා විශ්ලේෂණය කිරීම, ඔවුන් මුහුණ දෙන අභියෝග විමර්ශනය කිරීම සහ ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය සඳහා ක්‍රමෝපාය යෝජනා ඉදිරිපත් කිරීමයි. මෙම ආඛ්‍යාන සාහිත්‍ය විමර්ශනය සඳහා ජාත්‍යන්තර දත්ත ගබඩා පරිශීලනය කරමින් ප්‍රධාන දත්ත රැස් කිරීම සිදු කළ අතර, තේමාත්මක දත්ත විශ්ලේෂණයක් මගින් සංශ්ලේෂණය සිදු කර ඇත. ගුරුවරුන් සාම්ප්‍රදායික ඉගැන්වීමෙන් මිදී අත්‍යුත්‍ය පන්තිකාමර මෙහෙයවීමට සහ තාක්ෂණය අධ්‍යාපනයට ඒකාබද්ධ කිරීමට පුහුණු විය යුතු අතර, ශ්‍රී ලාංකීය ගුරුවරුන් තුළ පවතින තාක්ෂණය පිළිබඳ සෘණාත්මක ආකල්ප වෙනස් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, පාසල් පරිපාලනය තුළ දැඩි නීති-රීති වෙනුවට සාකච්ඡාව හා සම්මුතිය මත පදනම් වූ පරිවර්තනීය නායකත්වයක් පැවතිය යුතු අතර, දෙමාපියන් දරුවන්ගේ අධික ඩිජිටල් භාවිතය සුපරීක්ෂාකාරීව පාලනය කරමින් චරිත සංවර්ධනයට සහය විය යුතුය. මිශ්‍රිත ඉගෙනුම සහ ක්‍රීඩාකරණය වැනි නවෝත්පාදනීය ඉගෙනුම් ක්‍රම, සමාජ-භාවාත්මක ඉගෙනුම් ආකෘති සමඟ ඒකාබද්ධ කරමින්, සිසුන්ගේ සහභාගීත්වය වර්ධනය කිරීමටත්, විවේචනාත්මක චින්තනය, සන්නිවේදනය, සහයෝගීතාව සහ නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමටත් යොදාගත යුතුය. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සීමාවන් හා ආර්ථික බාධක පැවතියද, දරුවන්ගේ යහපැවැත්ම, ඩිජිටල් ආරක්ෂාව සහ මෘදු කුසලතා සුරකින නම්‍යශීලී අධ්‍යාපන මාර්ග සිතියමක් සකස් කිරීම මගින් ඇල්ෆා පරම්පරාව අනාගත ලෝකයට සාර්ථකව සූදානම් කළ හැකිය.


*මූඛ්‍ය පද:* ඇල්ෆා පරම්පරාව, අධ්‍යාපන පාර්ශ්වකරුවන්, අධ්‍යාපන ක්‍රමෝපාය, ඩිජිටල් ඉගෙනුම

Generation, Alpha Generation, Education Stakeholders, Education Strategy, Digital Learning

## හැඳින්වීම

ලෝක ව්‍යාප්තව සිදුවන වේගවත් ඩිජිටල් පරිණාමයත් සමඟ අධ්‍යාපන ක්ෂේත්‍රයද පරිවර්තනයකට ලක්වෙමින් පවතී. ඇල්ෆා පරම්පරාවේ දරුවන් වේගයෙන් තොරතුරු ග්‍රහණය කරගන්නා අතර ඔවුන්ගේ අන්තර්ක්‍රියා පෙර පරම්පරාවලට වඩා සුවිශේෂ වේ. ඔවුහු කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය සහ අතථ්‍ය අවකාශයන් (Virtual Spaces) සමග සහජ සන්නිවේදනයක් පවත්වති. එමෙන්ම ඔවුහු බරපතළ ලෙස මනෝ-සමාජීය ගැටලුවලටද මුහුණ දෙති. වර්තමාන සාම්ප්‍රදායික අධ්‍යාපන ව්‍යුහය මෙම දරුවන්ගේ ඉගෙනුම් වේගය හෝ රුචිකත්වයන් සමග සමපාත නොවන බව පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයේදී පැහැදිලි වේ. මෙම ආඛ්‍යාන සාහිත්‍ය විමර්ශනය ඔස්සේ ඇල්ෆා පරම්පරාවේ සුවිශේෂ හැසිරීම් රටා හඳුනා ගැනීමටත්, ශ්‍රී ලාංකීය අධ්‍යාපන පාර්ශ්වකරුවන් මුහුණ දෙන ප්‍රායෝගික, ආකල්පමය සහ යටිතල පහසුකම් ආශ්‍රිත අභියෝග විශ්ලේෂණය කිරීමටත් උත්සාහ කෙරේ. අවසාන වශයෙන්, ගෝලීය ප්‍රවණතා දේශීය යථාර්ථයන් සමග ගළපමින් ඇල්ෆා පරම්පරාවේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය සඳහා උපාය මාර්ග හඳුනා ගැනීම මෙහි මූලික අරමුණයි.

### පර්යේෂණ අරමුණු

1. ඇල්ෆා පරම්පරාවේ සුවිශේෂ මනෝ-සමාජීය සහ ඩිජිටල් චර්යා රටාවන් හඳුනා ගැනීම.

2. ඇල්ෆා පරම්පරාවේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය කිරීමේදී ශ්‍රී ලාංකීය අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ භූමිකා විශ්ලේෂණය කිරීම.

3. ඇල්ෆා පරම්පරාවේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය කිරීමේ ක්‍රියාවලියේදී අධ්‍යාපන පාර්ශ්වකරුවන් මුහුණ දෙන ආකල්පමය සහ පුහුණු ශ්‍රම අභියෝග විමර්ශනය කිරීම.

4. ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය කිරීමේදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල්කරණය උදෙසා පවතින යටිතල පහසුකම් අවශ්‍යතා සහ ආර්ථික බාධක තක්සේරු කිරීම.

5. සාහිත්‍ය විමර්ශන සංශ්ලේෂණය ඇසුරින් හඳුනාගත් ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය සඳහා ක්‍රමෝපාය යෝජනා ඉදිරිපත් කිරීම.

### ක්‍රමවේදය

මෙම පර්යේෂණය ආඛ්‍යාන සාහිත්‍ය විමර්ශන (Narrative Literature Review) ක්‍රමවේදය අනුව සිදු කරන ලදී. එහිදී ඇල්ෆා පරම්පරාවේ ඉගෙනුම් අවශ්‍යතා සහ අධ්‍යාපන ක්‍රමෝපායන් පිළිබඳ පවතින දැනුම සංශ්ලේෂණය කිරීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරන ලදී. මෙම පර්යේෂණයට අදාළ දත්ත රැස් කිරීම සඳහා Google Scholar, ResearchGate, Academia.edu සහ පිළිගත් ජාත්‍යන්තර අධ්‍යාපනික පර්යේෂණ දත්ත ගබඩා පරිශීලනය කරන ලද අතර, එහිදී "Generation Alpha", "Digital Natives", "Educational Stakeholders", "Digital Learning in Sri Lanka", "Pedagogical Strategies", "Education Strategies", "Blended Learning" යන මූල පද සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් සෙවුම් උපාය මාර්ග දියත් කරන ලදී. පර්යේෂණය සඳහා මූලාශ්‍ර තෝරා ගැනීමේදී ඇතුළත් කිරීමේ සහ බැහැර කිරීමේ නිර්ණායක අනුව, 2010 වසරෙන් පසුව පළ වූ පර්යේෂණ පමණක් විශ්ලේෂණයට ගන්නා ලද නමුත් එක් සුවිශේෂ දත්තයක් ලබා ගැනීම උදෙසා 2007 වර්ෂයේ පර්යේෂණයක් භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණ (Thematic Analysis) ක්‍රමවේදය භාවිත කළ අතර, දත්ත කේතනය කර, 'ඇල්ෆා චර්යා', 'පාර්ශ්වකරුවන්ගේ අභියෝග' සහ 'අධ්‍යාපනික ක්‍රමෝපායන්' ලෙස තේමාගත කෙරිණි. අවසාන වශයෙන්, එම තොරතුරු ශ්‍රී ලාංකීය අධ්‍යාපන සන්දර්භය හා එකිනෙක සසඳමින් සංශ්ලේෂණය කර ඇත. සාහිත්‍ය විමර්ශනය සංශ්ලේෂණය ඇසුරින් මතු වූ ප්‍රධාන පර්යේෂණ තේමා, ඇල්ෆා පරම්පරාවේ මනෝ-සමාජීය යථාර්ථය සහ ඔවුන්ටම ආවේණික ඩිජිටල් චර්යා රටාවන් විමර්ශනය කිරීම, ශ්‍රී ලාංකීය අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ භූමිකා සහ ඒ ආශ්‍රිතව නිර්මාණය වී ඇති ගැටලු සහ අභියෝග විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම, ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපනය සුසාධ්‍යකරණය කිරීමට බලපාන ආකල්පමය බාධා, ගුරු ප්‍රජාව සතු පුහුණු ශ්‍රම හිඟකම මෙන්ම පද්ධතිය තුළ පවතින භෞතික යටිතල පහසුකම් ආශ්‍රිත අභියෝග හඳුනා ගැනීම, වර්තමාන අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලනය තුළ නම්‍යශීලී පරිවර්තනීය නායකත්වය, ධනාත්මක සන්නිවේදනයක ඇති කාලීන අවශ්‍යතාව දැක්විය හැකිය. අවසාන වශයෙන්, මෙම සමස්ත සංශ්ලේෂිත සාහිත්‍ය ප්‍රවණතා පාදක කරගනිමින්, ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍ය කිරීම සඳහා ක්‍රමෝපාය යෝජනා සම්පාදනය කර ඇත.

## ‘පරම්පරාව’ සංකල්පීය නිර්වචන විශ්ලේෂණය

අධ්‍යාපන ක්ෂේත්‍රය පර්යේෂණ මත පදනම් වූ ගතිකත්වය අපේක්ෂිත සජීවී ක්ෂේත්‍රයකි. මිනිසුන් තුළ සුසමාහිත මනුෂ්‍යත්වය සහ සමාජ ඵලදායිබව පෝෂණය කිරීමේ සැලසුමෙහි පළමු අවශ්‍යතාව අනාගත ලෝකය උදෙසා වර්තමාන අධ්‍යාපනය සැලසුම් කිරීමය. මෙම ක්‍රියාවලියේදී අනාගත සමාජ පුරවැසියන්ගේ විකාශනය පර්යේෂණාත්මක ලෙස තහවුරු කරන සංකල්පය ‘පරම්පරාව’ (Generation) නම් සංකල්පයයි.

‘පරම්පරාව’ යන වචනය සාමාන්‍ය ව්‍යවහාරයේදී එකම පෙළපතකට අයත් එකම පෙළපත් නාමය හිමි පුද්ගලයන් සමූහයක් හැඳින්වීමට යොදාගත්තද, සමාජ විද්‍යාවේදී ගැඹුරු සහ නිශ්චිත අර්ථයකින් භාවිත වේ. Generation යන වචනය The Britannica Dictionary (2026 ජනවාරි 7) හි “එකම කාලයක ඉපදී ජීවත් වන පුද්ගලයින් පිරිසක්” ලෙස දක්වා ඇත. Yurtseven සහ Karadzin (2020) පරම්පරාව අර්ථ දක්වා ඇත්තේ මෙසේය:

> පරම්පරාව යන්නෙන් අදහස් කරන්නේ; සම වයසේ සිටින සමාජයක හෝ පවුලක පුද්ගලයන් ලෙස සැලකෙන, එකම වයසේ පරිසරයන් බෙදා ගන්නා, එමනිසා සමාන කරදර, සමාන උද්දීපනය, සතුට සහ තැතිගැනීම් බෙදා හදා ගන්නා පුද්ගලයන් සමූහයකි. ඔවුහු යම්කිසි අර්ථයකින් එක්සත් වූ පුද්ගල කණ්ඩායමක් නියෝජනය කරති. පෙර නොවූ මට්ටම්වලින්, පෙර නොවූ මට්ටම් ප්‍රදර්ශනය කරන අතර ජීවිතය පිළිබඳ නව හැඟීමක් සහ අවබෝධයක් ඇති කරයි (Yurtseven & Karadzin, 2020, පි.11).

පරම්පරාව පිළිබඳ පර්යේෂණය කරන McCrindle පර්යේෂණ ආයතනයේ McCrindle සහ Fell (2020) ‘කෙනෙකු ඉපදුණු මොහොතේ සිට දරුවන් ලැබීම දක්වා කාල පරාසය’ පරම්පරාව ලෙස අර්ථ දක්වා ඇත. දරු ප්‍රසූතියේ මධ්‍යන්‍ය වයස වසර 30ක් පමණ වන බැවින්, එම කාල පරාසය පරම්පරාවක් නිර්වචනය කිරීමට යොදා ගන්නා බවත්, වර්තමානයේ එය අවුරුදු 15 – 30 අතර විහිදෙන බවත් ප්‍රකාශ

කර ඇත (McCrindle & Fell, 2020). ඒ අනුව, පරම්පරාව යනු සමාජ විද්‍යාත්මක පදනම යටතේ නිශ්චිත කාල සීමාවක් තුළට ගොනු කළ හැකි, සමාන සංජානන සහ චර්යා ලක්ෂණ ප්‍රදර්ශනය කරන, අත්දැකීම් සහ ප්‍රතිචාර සමාන, සමාන ආශාවන්, හැකියාවන්, ආකල්ප සහ පොදු ලක්ෂණ සහිත එකම කාලයක ඉපදී ජීවත්වන මිනිසුන්ගේ එකතුවකි. පරම්පරාවක් විශ්ලේෂණය කරන්නේ එම කාලයේ මිනිසුන්ගේ පොදු ලක්ෂණ මත පදනම්වය. ඇල්ෆා පරම්පරාව පිළිබඳ අවබෝධ කරගැනීමට පරම්පරා විකාශනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ.

වගුව **1**

*පරම්පරා සංක්ෂිප්තය*

| *පරම්පරාව* | *කාලය* | ***2025*** *වන විට වයස* | *ලක්ෂණ* |
|---|---|---|---|
| Silent Generation<br>නිහඬ පරම්පරාව | 1945ට පෙර | අවු. 80+ | සාම්ප්‍රදායිකවාදීන්/පරිණතයන් ලෙසද හඳුන්වයි. කලබල නැති, නිහඬ මිනිසුන්ය. වික්‍රමාන්විත නැත. ලෝක සංග්‍රාමය දුටු සොල්දාදුවන්ගේ දරුවන්ය. |
| Baby Boomers<br>බේබි බූමර්ස් පරම්පරාව | 1946-1964 | අවු. 61-79 | තරඟකාරී, සේවා ළැදි, ඉලක්ක හඹායන පිරිසකි. විශ්‍රාම ගැනීමට පවා අකමැතිය. |
| Generation X<br>X පරම්පරාව | 1965-1976 | අවු. 49-60 | වැඩ පරිසරය සමබරය. පරිගණකය නිවසේදී සහ පාසලේදී දකියි. හුදකලාවට නැඹුරුය. |
| Generation Y<br>Y පරම්පරාව<br>(Millennials) | 1977-1996 | අවු. 29-48 | ශුභවාදීය. ආත්ම ගෞරවය ඇත. නව යොවුන් වියේදී හෝ වැඩිහිටි වියේදී අන්තර්ජාලය ඉගෙන ගනී. නිර්මාණශීලි, වෙනස්කම්වලට ගරු කරන තාක්ෂණික දැනුමැති පිරිසකි. |
| Generation Z<br>Z පරම්පරාව<br>(I Generation) | 1997-2010 | අවු. 16-28 | විවෘත මනසක් සහිත, සැහැල්ලු මිනිසුන්ය. ඩිජිටල් ලෝකයේ පළමු පරම්පරාවයි. ස්වාධීන, ස්වයං මත දරන පිරිසකි. ළමා කාලයේ සිට අන්තර්ජාලය දනී. ඩිජිටල් තිරවල සමාජ මාධ්‍ය ඔස්සේ පහසුවෙන් වැඩ කරයි. |
| Generation Alpha<br>Alpha පරම්පරාව | 2010-2025 | අවු.15 දක්වා ළමුන් | වේගවත් සංවර්ධනය සමග උපත ලබයි. අතථ්‍ය යථාර්තය (Virtual Reality) දකියි. අන්තර්ජාල ක්‍රීඩා (Gamification) ප්‍රිය වේ. සාකච්ඡාවෙන් සහ සම්මුතියෙන් වැඩ කළ යුතු, පිළිගැනීම දැඩි ලෙස අපේක්ෂා කරන පිරිසකි. න්‍යෂ්ටික පවුල් පරිසරය ප්‍රිය වේ. app ජීවිතයේ කොටසකි. Z පරම්පරාවේ බාල සහෝදර සහෝදරියන් වේ. ලෝක ඉතිහාසයේ විශාලම පරම්පරාව මෙන්ම විශාලම ආසියාතික පිරිස වේ. ඔවුන් ගැමා පරම්පරාවේ දෙමාපියන් වනු ඇත. |
| Generation Beta<br>Beta පරම්පරාව | 2025-2039 | | බීටා පරම්පරාව ජීවත් වනු ඇත්තේ; අධ්‍යාපනය, සේවා ස්ථාන, සෞඛ්‍ය සේවා සහ විනෝදාස්වාදය වැනි ජීවිතයේ සෑම අංගයක්ම ස්වයංක්‍රියකරණය කර ඇති යුගයකය. අතථ්‍ය පරිසරයන් දෛනික ජීවිතයේ සම්මත අංග ලෙස අත්විඳින පළමු පරම්පරාව වනු ඇත. ඇල්ගොරිතම ඔවුන්ගේ ජීවිතයේ කොටසක් වනු ඇත. |

ජනවිකාශඥයෙක් (Demographer) සහ සමාජ පර්යේෂකයෙක් වන McCrindle ඇල්ෆා පරම්පරාවේ නිල නාමය නිර්මාණය කර ඇත. Z පම්පරාවෙන් පසු ඔවුන්ට වඩා වෙනස් ගති ලක්ෂණ සහ ළැදියාවලින් යුක්ත නව පරම්පරාවක ආරම්භයක් සනිටුහන් කරන බැවින් ලතින් අක්ෂර වෙනුවට ග්‍රීක හෝඩියේ පළමු අක්ෂරය ඇල්ෆා (α) සුදුසු යැයි ඔහු යෝජනා කර ඇත (McCrindle & Fell, 2020).

**ඇල්ෆා පරම්පරාවේ සුවිශේෂ ලක්ෂණ**

McCrindle සහ Fellට (2020) අනුව ඇල්ෆා පරම්පරාවේ ලක්ෂණ ලෙස, යෙදුම් මත පදනම් වූ ක්‍රීඩාවල (app-based games) නිරත වීම, තිර මත ගත කරන කාලය (screen time) වැඩි වීම, කෙටි අවධානය (shorter attention spans), ඩිජිටල් සාක්ෂරතාව (digital literacy), අඩු සමාජ ගොඩනැගීම් (social formation), තොරතුරු සහ බාහිර බලපෑම් සඳහා ප්‍රවේශය, සමාජ මාධ්‍ය (social media) සහ වෙබ් අඩවි (websites) තුළ හැසිරීමේ සහ හැසිරවීමේ කුසලතා සහිත වීම, විවිධ රටවල් සහ බහු වෘත්තීන් අතර වැඩ කිරීම, විශ්ව ගම්මානයක ජීවත් වීම, අතථ්‍ය යථාර්ථය (virtual reality) (අතථ්‍ය සුරතලුන් සහ ක්‍රීඩා), ස්ත්‍රී - පුරුෂ මධ්‍යස්ථබව (gender neutrality), සහ සමානාත්මතා ප්‍රිය බව දැක්විය හැකිය (McCrindle & Fell, 2020).

ඇල්ෆා පරම්පරාව ඩිජිටල් ලෝකය තුළ කෙතරම් සුවිශේෂ වන්නේද යන්න ප්‍රදර්ශනය කරනු වස් ඔවුන් 'අංකිත ප්‍රාවේණිකයන්' (digital natives) ලෙස හඳුන්වති (Akmal et al., 2020; Arifa et at., 2021; Cimene et al., 2024; Gibson, 2024; Huss & Eastep, 2024). තාක්ෂණය ඔවුන්ගේ දෛනික ජීවිතයේ අනිවාර්ය අංගයක් වන අතර ඔවුන්ගේ ජීවන රටාවට සහ ඔවුන්ගේ හැසිරීම්වලට බලපෑම් කරන බව Reis et al. (2018) දක්වා ඇත. එමෙන්ම, මෙම පරම්පරාව විවිධ රටවල් අතර සංචාරය කරන අතර, බොහෝ වෘත්තීන් කිරීමට කැමති බැවින් තමන් සමාජ, ගෝලීය සහ ජංගම ලෙස සලකන බව Spasova (2022) දක්වා ඇත.

වේගවත් තාක්ෂණික යුගයක උපන් ඇල්ෆා පරපුර ඔවුන්ගේ ජීවිතය සහ සිතුවිලි අසීමාන්තිකව ප්‍රසිද්ධියේ බෙදා ගන්නා අතර සාම්ප්‍රදායික නොවන ලෙස වැඩෙනු ඇති බව Jha (2020) පෙන්වා දෙයි. ජයග්‍රහණය, ස්වාධිපත්‍යය, පිළිගැනීමේ අවශ්‍යතාව, තරඟකාරිත්වය, ස්වෛරීභාවය, නොපැහැදිලි නොඉවසීම, ආවේගශීලීත්වය, අවධානය සෙවීම සහ අවදානම් ගැනීමේ හැසිරීම් ඇල්ෆා පරම්පරාවේ ප්‍රමුඛ කැපී පෙනෙන ලක්ෂණ වන බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි (Jha, 2020).

ඇල්ෆා පරම්පරාව ඩිජිටල් ක්‍රියාකාරකම් සඳහා දක්ෂ වුවත් ඔවුන් තුළ ජීවන කුසලතා හිඟය, හුදකලාභාවය දක්නට ලැබෙන බව Jaiswal (2023) ප්‍රකාශ කරයි. එබැවින් ඔවුන් සමාජ විරෝධී බලපෑම් ජය ගැනීමට, අන්‍යෝන්‍ය පුද්ගල කුසලතා සංවර්ධනයට, සංස්කෘතිය ඉගෙනීමට උපකාර අවශ්‍ය පිරිසක් බවත්, අන්තර්ජාලයේ බොහෝ කාලයක් ගත කරන, සාම්ප්‍රදායික ක්‍රමවලින් සමාජගත වීමට කාලයක් නැති පිරිසක් බවත් තහවුරු කරයි.  මොවුන් ස්වයං - වර්ධනය කෙරෙහි දැඩි අවධානය යොමු කරන අති දක්ෂ සහ කඩිසර, අදහස් ප්‍රකාශ කිරීමට බිය නොවන පිරිසක් බව ද ඔහු ප්‍රකාශ කරයි (Jaiswal, 2023).

Huss සහ Eastep (2024) ඇල්ෆා පරම්පරාව සඳහා 'වීදුරු තිර පරම්පරාව' (Generation Glass) යන විශේෂ යෙදුම භාවිත කරයි. ඇල්ෆා පරම්පරාව හැඳින්වීමට 'වීදුරු තිර පරම්පරාව' යන යෙදුම යොදාගෙන ඇත්තේ  ඔවුන් ඩිජිටල් උපාංගවල වීදුරුවලින් ආවරණය කරන ලද තිර දෙස බලා හැදී වැඩුණු නිසා මෙන්ම, ඒවායේ බිඳෙනසුලු බව සහ ඇල්ෆා පරම්පරාවේ මානසික දුර්වලතා නිසා බව Huss සහ Eastep (2024) ප්‍රකාශ කරයි. තවද, ඇල්ෆා පරම්පරාව මානසික අවපීඩනයේ සලකුණු පෙන්නුම් කරන, සමාජ සබඳතා පැවැත්වීමේදී දුර්වල, නොඉවසිලිමත්, ගැටුම් ඇතිකරගන්නා පිරිසක් බැවින් චරිත සංවර්ධනය අවශ්‍ය පිරිසක් බව ඔවුන් විසින් ප්‍රකාශ කෙරෙයි. (Huss & Eastep, 2024)

ඇල්ෆා පරම්පරාවේ තාක්ෂණය භාවිතය සමාජ-චිත්තවේගීය සංවර්ධනය සඳහා ඇති අවස්ථා අඩු කර මානසික සෞඛ්‍ය ගැටලු වැඩි කර ඇති බවත්, කුතුහලයෙන් සිටින ඇල්ෆා පරම්පරාව නීති රීතිවලින්

නිදහස් වීම, කෝපයෙන් සිටීම, ආත්මාර්ථකාමී වීම වැනි හැසිරීම් ප්‍රදර්ශනය කරන බවත් පෙන්වා දෙන අතර ඉහළ ආත්ම අභිමානයක් ඇති ඔවුන් වඩාත් චිත්තවේගීය හා සංවේදී බවත් Höfrová සහ තවත් අය (2024) පෙන්වා දී ඇත (Höfrová et. al., 2024)

## ශ්‍රී ලංකාවට අදාළත්වය

ඇල්ෆා පරම්පරාව උපතේ සිටම තාක්ෂණය සමග හැදී වැඩෙන පළමු 'ඩිජිටල් ප්‍රවේණිකයන්' (digital natives) වන අතර, ඔවුන්ගේ ආගමනය ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතියට සංකීර්ණ බලපෑමක් එල්ල කරනු ඇත. ශ්‍රී ලංකාවේ බහුතරයක් අධ්‍යාපන පාර්ශ්වකරුවන් 'ඩිජිටල් සංක්‍රමණිකයන්' (digital immigrants) වීමත්, ඔවුන්ගේ සාම්ප්‍රදායික හා සෘණාත්මක ආකල්ප නිසාත් ඇල්ෆා දරුවන් හා ගනුදෙනු කිරීමට ඉගෙනගත යුතු බව දක්නට ලැබේ. තවද, පවතින ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය මන්දගාමී වීමත්, නාගරික හා ග්‍රාමීය පාසල් අතර විෂමතාව නිසාත් ඇල්ෆා සිසුන්ගේ අධ්‍යාපන සම අයිතිවාසිකම් අභියෝගයට ලක්ව තිබේ. එබැවින්, සාම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය විභාග ක්‍රමය තුළ පීඩාවට පත්වන මෙම සිසුන්ගේ මානසික හා තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි, සීමිත සම්පත් කළමනාකරණය කරගනිමින් අධ්‍යාපන ක්‍රමෝපාය සකස් කිරීමේ ජාතික අවශ්‍යතාවක් පවතී.

## ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ භූමිකා විශ්ලේෂණය

### *ඇල්ෆා පරම්පරාවේ ගුරු භූමිකාව*

"Z සහ ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපනය සඳහා තාක්ෂණික ඉදිරි දර්ශන" (Technological perspectives of education for Generation Z and Generation Alpha) ක්‍රමානුකූල ආඛ්‍යාන විමර්ශන පර්යේෂණය ඔස්සේ පරම්පරා දෙකෙහි අධ්‍යාපනික වෙනස සහ තාක්ෂණික පිළිගැනීම Soly සහ තවත් අය (2021) විශ්ලේෂණය කර ඇත.

> අධ්‍යාපනඥයින්ගේ දෘෂ්ටිකෝණයෙන්: ගුරුවරුන් සහ ගුරුවරුන්ගේ සාම්ප්‍රදායික චින්තන ක්‍රම, ඔවුන්ගේ අදහස් වෙනස් කළ යුතු අතර වෙනස් වන අවස්ථාවන්හිදී ඉගෙනීම ලබා දිය යුතුය. විශේෂයෙන් සැබෑ පන්ති කාමරවලින් අතථ්‍ය පන්ති කාමර, අධ්‍යාපන වේදිකා වෙත

මාරු කිරීමේ දැඩි අවශ්‍යතාවක් ඇත. මෙය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා පවතින පද්ධතිවලට සම්පූර්ණ සුසමාදර්ශී වෙනසක් අවශ්‍ය වේ (Soly et al., 2021, පි.166).

අන්තර්ජාලය හරහා ඉගැන්වීමට, සුහුරු පන්ති හැසිරවීමට ගුරුවරුන් පුහුණු කිරීමට අවශ්‍ය බවත්, අධ්‍යාපනඥයින්ට අතථ්‍ය පන්තිකාමර මෙහෙයවීමට නිසි පුහුණුවක් ලබා දීමෙන් ඉගෙනීමේ ක්‍රියාවලියේ තාක්‍ෂණ දැනුමේ හිඩැස පළමුව පිරවිය යුතු බවත් පර්යේෂකයන් පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. සිසුන් Google, LinkedIn, Moodle, Google Classroom සහ සමාජ මාධ්‍ය (social media) වැනි විවිධ ඩිජිටල් ඉගෙනුම් වේදිකා භාවිත කරන බව පෙන්වා දෙන අතර ඩිජිටල්කරණය සහ තාක්‍ෂණය සමඟ ගුරුවරු සම්පූර්ණයෙන්ම ගැළපුණු පසු ඔවුන්ට වඩාත් ඵලදායී ලෙස අතථ්‍ය පන්ති සමග ඉදිරියට යා හැකි බව  පර්යේෂණ අනාවරණය කරයි.

"ඇල්ෆා පරම්පරාව සහ අධ්‍යාපනය" (Generation Alpha and the education), පාසල සහ අධ්‍යාපනය පිළිබඳ ඇල්ෆා පරම්පරාවේ දරුවන්ගේ සංජානන ගවේෂණය කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමට පාසල්වලට හැකිද යන්න සලකා බැලීම සඳහා Spasova (2022) විසින් සිදු කරන ලද පර්යේෂණයකි. ස්වාධීන හා කුතුහලයෙන් පිරි ලෝකය පිළිබඳ ඔවුන්ගේම දැක්මක් ඇති ඇල්ෆා දරුවන් ඔවුන්ගේ දෙමාපියන්ට සහ ගුරුවරුන්ට වඩා වෙනස් පිරිසක් බැවින් ඔවුන් අතර ගැටුම්කාරී තත්ත්වයන් දක්නට ලැබෙන බව ප්‍රකාශ කරන ඔහු, වෘත්තීය වගවීමේදී ප්‍රතිචාර දැක්වීමට අධ්‍යාපනඥයින් අසමත් බව පෙන්වා දෙයි (Spasova, 2022).

ඇල්ෆා පරම්පරාවේ සිසුන්ගේ ඉගෙනුම් සහභාගීත්වය කෙරෙහි ඉගෙනුම් - ඉගැන්වීමේ විලාසයන්ගේ බලපෑම විමර්ශනය කිරීමෙ අරමුණින් Cimene සහ තවත් අය (2024)  පිලිපීනයේ දියත් කළ පර්යේෂණය, ඩිජිටල් යුගයේ අභියෝග සඳහා සූදානම් වන නම්‍යශීලි අධ්‍යාපනයක් ඇල්ෆා පරම්පරාවට ලබා දීම උදෙසා අධ්‍යාපනඥයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් වෙනස්කම්වලට අනුගත විය යුතු බව අවධාරණය කරයි (Cimene et al, 2024).

'ඇල්ෆා පරම්පරාවේ සිසුන් පිළිබඳ මධ්‍යම පාසල් ගුරුවරුන්ගේ සංජානනය පිළිබඳ ප්‍රාන්ත තුනක අධ්‍යයනයක්: මධ්‍යම පාසල් "වීදුරු තිර පරම්පරාව" සඳහා සූදානම්ද?' (A tri-state study of middle school teachers' perceptions of Generation Alpha students: Are middle schools ready for "Generation Glass?") යන පර්යේෂණයේ Huss සහ Eastep (2024) බොහෝ ගුරුවරුන් තාක්ෂණය පන්ති කාමර මෙවලමක් ලෙස ද, සිසුන් එය ජීවන මාර්ගයක් ලෙසද සලකන බව පෙන්වා දී ඇත. මෙම නොගැළපීම නිසා දරුවන්ට දෛනික ඩිජිටල් පන්ති කාමර පසුබිමක් ලබා දිය යුතුද නැතිද යන්න පිළිබඳ ගුරුවරුන්ට උභතෝකෝටිකයක් නිර්මාණය වී ඇති බව ඔවුන් විසින් පෙන්වා දී ඇත (Huss & Eastep, 2024).

"ඇල්ෆා පරම්පරාව සඳහා අධ්‍යාපනය පිළිබඳ ක්‍රමානුකූල සාහිත්‍ය විමර්ශනයක්" (A systematic literature review of education for Generation Alpha) යන පර්යේෂණයේ Höfrová සහ තවත් අය (2024) විසින් ඇල්ෆා පරම්පරාවේ තාක්ෂණ භාවිත ළැදියාව සහ චිත්තවේග අධ්‍යාපන අවශ්‍යතාව අනුව ගුරුවරු අධ්‍යාපනය ලබා දීම සැලසුම් කළ යුතු බව පෙන්වා දෙයි. ඇල්ෆා පරම්පරාවට අධ්‍යාපනය ලබා දීමේදී මුලින්ම බලපෑමට ලක් වන්නේ ගුරුවරුන් බවත්, ඔවුන්ට ප්‍රමාණවත් සූදානමක් සහ පුහුණුවක් නැති බවත් ඔවුහු ප්‍රකාශ කරති (Höfrová et al., 2024).

> ඇල්ෆා පරම්පරාව සුවිශේෂ ලක්ෂණ සහිත වුවත් නම්, ඔවුන්ගේ නව්‍ය ඉගැන්වීමේ උපාය මාර්ග අවශ්‍යතා හේතුවෙන් මුලින්ම බලපෑමට ලක් වන්නේ ගුරුවරුන් වේ (Höfrová et al., 2024, පි. 9)

උක්ත පර්යේෂණ සාහිත්‍යයට අනුව මුලින්ම බලපෑමට ලක්වන ගුරු භූමිකාව, ඇල්ෆා පරම්පරාවේ තාක්ෂණික ළැදියාව සහ චිත්තවේගීය අවශ්‍යතා හඳුනා ගනිමින් ප්‍රතිසංවිධානය විය යුතුය. අතථ්‍ය සහ සුහුරු පන්තිකාමර මෙහෙයවීමට ගුරුවරුන් පුහුණු කිරීමෙන් ඔවුන්ගේ නව තාක්ෂණ දැනුමේ හිඩැසද, ඇල්ෆා සිසුන්ගේ සංජානන පිළිබඳ මනෝවිද්‍යාත්මක සමාජ විද්‍යාත්මක දැනුමේ හිඩැසද පිරයවිය

යුතුය. මේ සඳහා අධ්‍යාපනඥයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ද නව වෙනස්කම්වලට කඩිනමින් අනුගත වීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ ඇල්ෆා පරම්පරාව සම්බන්ධ පර්යේෂණ දුලභ වුවත්, ගුරුවරුන්ගේ තාක්ෂණික සහ අන්තර්ජාල භාවිත ඉගැන්වීම් සම්බන්ධව විමර්ශන ඔස්සේ ඇල්ෆා පරපුරට ඉගැන්වීමට ඇති සූදානම විමර්ශනය කළ හැකි වේ.

"ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසල් තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානයේ භාවිතය" ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන භාවිතය සම්බන්ධයෙන් බණ්ඩාරනායක (2018) විසින් සිදු කරන ලද සමීක්ෂණයේ ගුරුවරුන්ගේ නව තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රබල ගැටලුවක් ඇති බව පෙන්වා දී ඇත. ගුරුවරුන්ගේ තාක්ෂණික මධ්‍යස්ථාන භාවිතය පිළිබඳ විමසීමේදී, ඔවුන්ගේ තාක්ෂණික මධ්‍යස්ථාන භාවිතය තීරණය වන්නේ පෞද්ගලික දැනුම, කුසලතා, ආකල්ප මත බව පෙන්වා දෙන පර්යේෂකයා, ගුරුවරුන් 88%ක් තම ඉගැන්වීම් කටයුතු සඳහා පරිගණක භාවිත නොකරන බව අනාවරණය කරයි. මෙම පර්යේෂණය මගින් පරම්පරා වෙනස සමබර කිරීමට යෝජනා අවශ්‍ය බවත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පරිගණක සහ තාක්ෂණික උපකරණ භාවිතයට ඇති හැකියාව සංවර්ධනය කරගැනීම උදෙසා ගුරුවරුන්ගේ සෘණාත්මක ආකල්ප වෙනස් කළ යුතු බවත් යෝජනා කර ඇත.

*ඇල්ෆා පරම්පරාවේ පාසල් පරිපාලන භූමිකාව*

"පාසල් පරිපාලනය සහ Z පරම්පරාවේ සිසුන්: ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා පර්යාවලෝකන" (School administrators and Generation Z students' perspectives for a better educational setting) යන මැයෙන් Cetin සහ Halisdemir (2019) තුර්කියේ සිදු කළ පර්යේෂණය Z පරම්පරාව පිළිබඳව වුවත් එහි අන්තර්ගතය ඇල්ෆා පරම්පරාවට ද ඉතා වැදගත් වේ.

"ලාබාලම Z පරම්පරාව සහ වැඩිහිටි ඇල්ෆා පරම්පරාවේ සේවා ස්ථාන පරිසරය බොහෝ දුරට සමාන බව පෙනේ" (Jaiswal, 2023, පි. 597) යන ප්‍රකාශය අනුව, Cetin සහ Halisdemir (2019) විසින් සිදු කරන ලද පර්යේෂණය ඇල්ෆා පරම්පරාව පිළිබඳ විමර්ශනය සඳහා උපයෝගී කර ගැනීම උචිත වේ. එම පර්යේෂණයේ නව පරපුර වැඩිහිටි පරම්පරාවේ මුල් බැසගත් සාරධර්ම නොසලකාහරින ආකාරය දැකීමෙන් විමතියට පත්ව සිටින බවත්, පාසල් තුළ ඇති වන ගැටුම්වලට ප්‍රධාන හේතුව පරම්පරා පරතරය බවත් පෙන්වා දෙයි. සාම්ප්‍රදායික ක්‍රමය තුළ හැදී වැඩුණු අධ්‍යාපන පරිපාලකයන්ට නුහුරු ගැටලු රැසකට මුහුණ දීමට සිදුව ඇති බව පෙන්වා දෙන පර්යේෂකයෝ X සහ Y පරම්පරා වල අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක කළ දැඩි නීති, බිය දනවන ආධිපත්‍යය වර්තමානයට වලංගු නොවන බව ප්‍රකාශ කරති. අධ්‍යාපන පරිපාලකයන්ට සමාජ විද්‍යාත්මක පදනමෙන් පරම්පරාවන් පිළිබඳව දැනුම ලබා දිය යුතු බව ඔවුහු යෝජනා කරති (Cetin & Halisdemir, 2019).

"ඇල්ෆා පරපුර සහ අධ්‍යාපනය" පර්යේෂණයේ නිගමන ඔස්සේ Spasova (2022) විසින් ඇල්ෆා සිසුන් සමග වැඩිහිටියන් සන්නිවේදය කළ යුතු ධනාත්මක දෘෂ්ටිය පිළිබඳ සාකච්ඡා කරනු ලබයි.

> ඇල්ෆා පරපුර සමග සන්නිවේදනය කිරීම සඳහා වැඩිහිටියන්ගේ පැත්තෙන් සාකච්ඡා කිරීම සහ සම්මුතිය මත පදනම් වූ ප්‍රවේශයක් අවශ්‍ය වේ. දෙමව්පියන් සහ ගුරුවරුන් ඔවුන්ව හොඳින් තේරුම් ගෙන සහයෝගය දැක්විය යුතු අතර, ඔවුන්ව විවේචනය නොකිරීම සහ අඩු ප්‍රචණ්ඩත්වයෙන් දැනුවත් කිරීම කළ යුතුය" (Spasova, 2022, පි.65).

Cetin and Halisdemir (2019) සහ Spasova (2022) අනුව ශ්‍රී ලංකාවේ ඇල්ෆා සිසුන් සමග සහසම්බන්ධ වන විදුහල්පතිවරු ඇතුළු සියලු අධ්‍යාපන පාර්ශ්වයන්ගේ සාම්ප්‍රදායික සන්නිවේදන රටාවන් ප්‍රතිසංවිධානය කළ යුතු බව පැහැදිලි වේ.

"ඇල්ෆා පරම්පරාව සඳහා මානව සම්පත් උපාය මාර්ග සහ එහි ස්වරූපය කුමක්ද?" (HR strategies for Generation Alpha: What would it look like?) පර්යේෂණයේ Jaiswal (2023) විසින් ඇල්ෆා

පරම්පරාව සඳහා උපයෝගී කර ගත යුතු මානව සම්පත් උපාය මාර්ග විමර්ශනය කරයි. ඇල්ෆා පරම්පරාව පවතින සම්ප්‍රදාය අනුව වෙනස් කිරීම ඔවුන්ගේ කාර්යක්ෂමතාව අඩු කිරීමට සහ ගැටුම් ඇති කිරීමට හේතුවක් විය හැකි බැවින් උචිත මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග සකස් කළ යුතු බව Jaiswal (2023) පෙන්වා දෙයි. නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය සඳහා අවකාශය ලබා දීම, ස්වාධීන ආයතනික සන්නිවේදන රටා ස්ථාපනය, ස්වයං-වර්ධනය සහ බහු-කාර්ය නියැළීමට අවකාශය, බහු රැකියා සහ නව්‍ය රැකියා අවස්ථා නිර්මාණය, යහපැවැත්ම සඳහා ප්‍රමුඛතාව දීම කළ යුතු බවට Jaiswal (2023) යෝජනා කරයි. ඔවුන් සයිබර් හිරිහැර කිරීම් සහ අපරාධවලටද නිරාවරණය වන බැවින් මානසික සෞඛ්‍යය ප්‍රමුඛ ලෙස සැලකිය යුතු බවත්, ඩිජිටල් ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් ඉදිරිපත් කළ යුතු බවටත් ඔහු යෝජනා කරයි. පාසලේ මානව සම්පත වන ඇල්ෆා පරම්පරාවේ සිසුන් සම්බන්ධව කටයුතු කිරීමේදී මෙරට අධ්‍යාපන බලධාරීන්ද මෙම සුවිශේෂ පරම්පරාවේ අවශ්‍යතා සලකා බැලීම අවශ්‍යතාවක් වේ.

“අධ්‍යාපන සුසමාදර්ශය වෙනස් කිරීමේදී පරිවර්තනීය නායකත්වය: ඇල්ෆා පරම්පරාවේ ශිෂ්‍යයාගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම” (Transformational leadership in changing the education paradigm: Improving the quality of Alpha Generation student) යන ඉන්දුනීසියානු සිද්ධි අධ්‍යයනය ඔස්සේ Karomi සහ Mamlukhah (2025) පරිවර්තනීය නායකත්වය මගින් මෘදු කුසලතා සංවර්ධනය කිරීම, වෙනස්වන ලෝකයක අභියෝගවලට මුහුණ දීම සඳහා ඇල්ෆා පරම්පරාවේ සිසුන් සූදානම් කිරීම, ඉගෙනීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම කළ හැකි බව පෙන්වා දී ඇත (Karomi & Mamlukhah, 2025).

මේ අනුව අධ්‍යාපන පරිපාලකයන් අධිකාරීත්ව පාලනය වෙනුවට ඇල්ෆා පරම්පරාවට ගැළපෙන සාකච්ඡාව සහ සම්මුතිය මත පදනම් වූ පාලන ප්‍රවේශයන් අනුගමනය කරන, පරිවර්තනීය නායකත්වය මගින් ඇල්ෆා පරපුරේ අවශ්‍යතා හඳුනා ගන්නා, මෘදු කුසලතා වර්ධනය සහ සිසුන්ගේ මානසික

සෞඛ්‍යය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරන, ඩිජිටල් තාක්ෂණය පිළිබඳ දැනුමෙන් යාවත්කාලීන වූ භූමිකා බවට පරිවර්තනය කිරීම අවශ්‍ය වේ.

***ඇල්ෆා පරම්පරාවේ දෙමාපිය භූමිකාව***

ඇල්ෆා පරම්පරාවේ ඉගෙනුම් අවශ්‍යතා සුසාධ්‍යකරණය කිරීමේදී අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ භූමිකාවන් අතරින් දෙමාපියන් වඩාත් වැදගත් වන්නේ දරුවකුගේ අධ්‍යාපනයේ දිශානතිය තීරණය කිරීමේදී බලපෑම් කිරීමට හැකි ප්‍රධාන මැදිහත්කරුවන් දෙමාපියන් වන බැවිනි.

"ඇල්ෆා පරම්පරාවේ උපකරණ භාවිතයට සහාය වීමේදී දෙමාපියන්ගේ කාර්යභාරය" (The role of parents in assisting the use of gadget in alpha generation) පර්යේෂණයේ Novianti සහ Maria (2019) විසින් ඇල්ෆා පරපුරේ දෙමාපිය භූමිකාවේ වගකීම විශ්ලේෂණය කර ඇත.

> දෙමාපියන්ට දරුවන් උපකරණවලින් වළක්වා ගත නොහැකි ය. ඔවුන්ට කළ හැක්කේ නීති රීති සැකසීම සහ තාක්ෂණයේ ධනාත්මක බලපෑම ලබා ගැනීම සඳහා එය භාවිත කිරීම අධීක්ෂණය කිරීමයි (Novianti & Maria, 2019, පි. 262).

McCrindle සහ Fell (2020) විසින් ප්‍රකාශිත "ඇල්ෆා පරම්පරාව වටහා ගැනීම" (Understanding Generation Alpha) පර්යේෂණයේ ඇල්ෆා පරම්පරාවේ දෙමාපිය වගකීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

> බොහෝ යෞවනයන් අවිනිශ්චිත අනාගතයක් පිළිබඳ අනාරක්ෂිතභාවයට සහ මානසික සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දෙන බැවින් මාපියන් විසින් ඇල්ෆා පරම්පරාව සඳහා ආත්ම විශ්වාසය ලබා දිය යුතුය. අනාගතය සඳහා ආයෝජනය කිරීමට දෙමාපියන් ඇල්ෆා පරම්පරාව දිරිමත් කළ යුතුය (McCrindle & Fell, 2020, පි. 17).

ඇල්ෆා පරම්පරාව වෙනුවෙන් අධ්‍යාපනය සුසාධ්‍යකරණ ක්‍රමෝපාය සකස් කිරීමේදී දෙමාපිය මැදිහත්වීමේ අවශ්‍යතාව සහ එහි ඵලදායී බව Akmal සහ Hikmah (2020) "දෙමාපියන්ගේ

සහභාගීත්වයෙන් සමාජ-චිත්තවේගීය ඉගෙනීම තුළින් ඇල්ෆා පරම්පරාවේ චරිත සංවර්ධනය" (Character development in Generation Alpha through social-emotional learning with parent involvement) පර්යේෂණයේ පෙන්වා දී ඇත.

> දෙමාපියන් සමඟ සහයෝගීතාවෙන් යුත් සමාජ චිත්තවේගීය සංවර්ධන මැදිහත්වීමේ ආකෘතියක් පාසල්වලට අවශ්‍ය වේ (Akmal & Hikmah, 2020, පි. 87).

දරුවන් සුහුරු දුරකථනය, සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල ක්‍රීඩා භාවිත කිරීම පිළිබඳව දෙමාපියන් බියක් ඇති කරගත් බවත්, දරුවන්ගේ වර්ධනයට හිතකර නොවන, දෙමාපියන්ට ආගන්තුක වෙනස්කම් ගැන දෙමාපියන් බියෙන් සිටින බවත් Soly සහ තවත් අය (2021) ප්‍රකාශ කරති. කාර්මීකරණය සහ තාක්ෂණික දියුණුව විරාගත සදාචාරාත්මක සාරධර්ම සහ මානව බැඳීම් පිරිහීමට හේතු වූ බැවින් මෙලෙස සිතීම පිළිබඳ දෙමාපියන්ට දොස් පැවරිය නොහැකි බව ප්‍රකාශ කරන පර්යේෂකයෝ ඩිජිටල් පරම්පරාවේ දරුවන්ගේ අවශ්‍යතා කළමනාකරණය කිරීමේදී ඔවුන්ගේ සාධාරණ බිය පිළිබඳ අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙති.

"ඇල්ෆා පරම්පරාව මානව සම්පත් දෘෂ්ටිකෝණයකින් ගවේෂණය කිරීම" (Exploring Generation Alpha with an HR perspective) අධ්‍යයනය ඔස්සේ Karthikeyan (2022) ඇල්ෆා පරම්පරාව සමාජයෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද? එම වෙනස්කම් හේතුවෙන් ඇතිවන සමාජ විද්‍යාත්මක හා මානසික වෙනස්කම් මොනවාද? සීමාවන් මොනවාද? යන්න ගවේෂණය කරයි. ඇල්ෆා සිසුන්ට බලපෑම් ඇතිකරන පාර්ශ්ව අතරින් දෙමාපියන් ඉතා වැදගත් බව පෙන්වා දෙන ඔහු, ඇල්ෆා පරපුරට මූලික පීඩනය එල්ලවීම ආරම්භ වන්නේ උසස් සාම්ප්‍රදායික ශාස්ත්‍රීය දැනුමැති සහස්‍ර දෙමාපියන්ගෙන් බව ප්‍රකාශ කරයි. එමෙන්ම, තාක්ෂණය සමග ගමන් කරන ඇල්ෆා පරම්පරාව පෞද්ගලික හා සමාජ ජීවිතයට පවා තාක්ෂණය ඉල්ලා සිටින බව ද පර්යේෂකයා ප්‍රකාශ කරයි. ඇල්ෆා පරම්පරාව නිරන්තර වෙනස්කම් අවශ්‍ය පිරිසක් බැවින් හැසිරවීමට දුෂ්කර බවත්, දෙමාපියන්ගේ ප්‍රවේශය නිරන්තරයෙන් යාවත්කාලීන කළ යුතු බවත් පර්යේෂකයා තවදුරටත් අනාවරණය කරයි (Karthikeyan, 2022).

"ඇල්ෆා පරම්පරාවේ ඩිජිටල් ක්‍රියාකාරකම් සඳහා දෙමාපියන්ගේ සහභාගීත්වය විමර්ශනය කිරීම" (Investigating parental involvement in Alpha Generation's digital activities) නමින් පාකිස්ථානය කේන්ද්‍ර කරගනිමින් Rahim සහ තවත් අය (2024) විසින් කළ පර්යේෂණය පෙන්වා දෙන්නේ දෙමාපියන් තම දරුවන්ට සමීප වීමෙන් සහ සුපරීක්ෂාකාරී නිරීක්ෂණය මගින් ඔවුන්ගේ අධික ඩිජිටල් උපාංග භාවිතය පාලනය කළ හැකි බවත්, එළිමහන් ක්‍රීඩාවල නිරත විය යුතු බවත්, ඩිජිටල් උපාංග අධික ලෙස භාවිතයේ හානිකර ප්‍රතිවිපාක පිළිබඳව පැහැදිලිව දැනුවත් විය යුතු බවත්ය (Rahim et al., 2024). මේ අනුව දරුවන්ගේ අධික ඩිජිටල් භාවිතය, අධීක්ෂණය ඔස්සේ සුමටව පාලනය කරන්නා වූ, සමීප සහභාගීත්වය හරහා ඇල්ෆා පරම්පරාවේ චරිත සංවර්ධනය සිදු කළ හැකි දෙමාපිය භූමිකා සකස් කිරීම අවශ්‍ය වේ.

***ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ ගැටලු සහ ඉදිරිපත් කර ඇති යෝජනා***

Akmal සහ Hikmah (2020) "දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් සමාජ-චිත්තවේගීය ඉගෙනීම තුළින් ඇල්ෆා පරම්පරාවේ චරිත සංවර්ධනය" (Character development in Generation Alpha through social-emotional learning with parent involvement) යන පර්යේෂණය මගින්, අධ්‍යාපන සැලසුම් යනු හුදෙක් දැනුම පදනම් කරගත් නව විෂය නිර්දේශයක් නොවන බව පෙන්වා දෙති. තොරතුරුවල බහුලතාව මෙන්ම පහසු ප්‍රවේශ, මාධ්‍යවලින් ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් වැඩි වශයෙන් දැකගතහැකි වීම වැනි හේතු සාධක නිසා ඇල්ෆා දරුවන්ගේ සමාජ ගැටලු වැඩි බවත්, මෙහි අපරාධකරුවන් සහ වින්දිතයින් යන දෙපිරිසම දරුවන් බැවින් කුඩා කල සිටම දරුවන් ප්‍රචණ්ඩත්වයෙන් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගත යුතු බවත් පර්යේෂකයෝ පෙන්වා දෙති. මේ සඳහා දරුවන්ගේ සමාජ-චිත්තවේගීය හැකියාවන් ප්‍රශස්ත කළ හැකි ඉගෙනුම් ආකෘති සකස් කළ යුතු බව පෙන්වා දෙන පර්යේෂකයෝ සමාජ-චිත්තවේගීය ඉගෙනුම් ආකෘතිය (Social Emotional Learning Model) ඉදිරිපත් කරති (Akmal & Hikmah, 2020). මෙම ආකෘතිය ඔස්සේ චිත්තවේගීය ක්ෂේත්‍ර පහක් සංවර්ධනය කරයි. එම ක්ෂේත්‍ර වන්නේ;

(1) ස්වයං දැනුවත්භාවය - පෞද්ගලික හැඟීම්, සිතුවිලි සහ විනිශ්චයන් නිවැරදිව හඳුනා ගැනීමේ හැකියාව සහ ඒවා හැසිරීමට බලපාන ආකාරය

(2) ස්වයං කළමනාකරණය - ආතතිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමෙන්, ආවේග පාලනය කිරීමෙන් සහ තමාවම පෙලඹවීමෙන් පෞද්ගලික හැඟීම්, සිතුවිලි සහ හැසිරීම් නියාමනය කිරීමේ හැකියාව

(3) සමාජ දැනුවත්භාවය - විවිධ පසුබිම්වල සහ සංස්කෘතිවල පුද්ගලයින් ඇතුළුව අන් අය සමඟ සංනිවේදනය කිරීමේ හැකියාව

(4) සම්බන්ධතා කුසලතා - විවිධ පුද්ගලයින් සහ කණ්ඩායම් සමඟ සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රයෝජනවත් සබඳතා ගොඩනඟා ගැනීමට සහ පවත්වා ගැනීමට ඇති හැකියාව

(5) වගකිවයුතු තීරණ ගැනීම - පෞද්ගලික හැසිරීම් සහ සමාජ අන්තර්ක්‍රියා පිළිබඳ ඵලදායී තේරීම් කිරීමේ හැකියාව

දෙමාපියන් සම්බන්ධ කරගනිමින් චිත්තවේග සංවර්ධනය කිරීමේ සැලසුම් විධිමත් ලෙස පාසල් විසින් සකස් කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බවට මෙම පර්යේෂණය පෙන්වා දෙයි.


"ඇල්ෆා පරම්පරාව පිළිබඳ දළ විශ්ලේෂණයක්" (An overview of Generation Alpha) පර්යේෂණයේ Yurtseven සහ Karadeniz (2020) ඇල්ෆා පරම්පරාවේ ශිෂ්‍යයකුගේ වර්ධනය සඳහා සිසුන්, ගුරුවරුන් හා පාසල් පරිපාලකයන්ටද අවශ්‍ය ඉගෙනුම් සහ නවෝත්පාදන කුසලතා හතරක් "4Cs" ලෙස හඳුන්වා දෙති. එම කුසලතා හතර වන්නේ විවේචනාත්මක චින්තනය (critical thinking), සන්නිවේදනය (communication), සහයෝගීතාව (collaboration) සහ නිර්මාණශීලීත්වය (creativity)ය. පවතින පාසල් සංස්කෘතිය මෙම කුසලතා නිරන්තරයෙන් වගා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පර්යේෂකයෝ ප්‍රකාශ කරති.

ඇල්ෆා දරුවන්ට අවශ්‍ය කුමක්ද? ඔවුන්ට ලබා දිය යුත්තේ කෙබඳු අධ්‍යාපනයක්ද? යන්න විමර්ශනය කරමින් Arifah සහ තවත් අය (2021) විසින් සිදු කරන ලද "සිවුවන කාර්මික යුගයේ ඇල්ෆා පරම්පරාව

සඳහා අධ්‍යාපනික සැලසුම්" (Educational design for Alpha generation in the Industrial Age 4.0) යන පර්යේෂණය ඇල්ෆා සිසුන්ගේ අධ්‍යාපනයේ සියලු දිශාවන් ආවරණය කිරීමට හැකි අධ්‍යාපන රටාවක් ලෙස 'මිශ්‍රිත ඉගෙනුම' හඳුන්වා දෙයි. අර්ථවත් ඉගෙනුම් අත්දැකීමක් සඳහා සිසුන්ගේ නිර්මාණශීලිත්වය හඳුනා ගැනීම, ඔවුන් දිරිමත් කිරීම සහ සංවර්ධනය කිරීම ඇල්ෆා පරපුරේ අධ්‍යාපනඥයාගේ ප්‍රධාන භූමිකාව බව විය යුතු බවත්, ඇල්ෆා සිසුන්ට ප්‍රත්‍යක්ෂ ඉගෙනුම සහ ඊට උචිත නව ඉගෙනුම් ද්‍රව්‍ය සහ උපාංග සකස් කළ යුතු බවත් ඔවුහු පෙන්වා දෙති. Arifah සහ තවත් අය (2021) ඇසුරින් රූප සටහන 1ට අනුව විශ්ලේෂිත වත්මන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ හඳුනාගත් ගැටලු ශ්‍රී ලංකාවටද ආදේශ කළ හැකිය.

**රූප සටහන 1**

*වත්මන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ හඳුනාගත් ගැටලු*




[Arifah et al., (2021) ඇසුරින්]

"ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා විද්‍යුත් ඉගෙනුම් වේදිකා පිළිබඳ දළ විශ්ලේෂණය" (Overview of e-learning platforms for teaching and learning) පර්යේෂණ පත්‍රිකාව මගින් පුද්ගල ආකල්ප වෙනස් කිරීම, දිශාභිමුඛගත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි (Ouadoud et al., 2021). ඊ-ඉගෙනුම් පද්ධති (e - learning systems), ඉගෙනුම් වේදිකා (learning platforms), ක්‍රියාකාරී ශිල්ප සැලසුම් (functional architectures), විද්‍යුත් ඉගෙනුම් උපාංග (e-learning devices) පිළිබඳ Ouadoud සහ තවත් අය (2021) ගැඹුරින් විශ්ලේෂණය කරයි. සැලසුමක් සාර්ථක වන්නේ එය ක්‍රියාත්මක කරන්නන්ගේ ක්‍රියාකාරිත්වයේ සාර්ථකත්වය මත බැවින් ඔවුන්ගේ ධනාත්මක ආකල්ප සංවර්ධනය අත්‍යවශ්‍ය බව පෙන්වා දෙයි. උක්ත පර්යේෂණ, අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ ආකල්ප පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙයි.

"Z සහ ඇල්ෆා පරම්පරා සඳහා අධ්‍යාපනය සඳහා තාක්ෂණික ඉදිරි දර්ශන" (Technological perspectives of education for Generation Z And Generation Alpha) පර්යේෂණයේ ඇල්ෆා පරම්පරාවේ සිසු අධ්‍යාපන සුසාධ්‍යකරණය සඳහා කළ යුතු වෙනස්කම් රැසක් Soly සහ තවත් අය (2021) පෙන්වා දෙති. අතථ්‍ය පන්තිකාමර ඵලදායී ලෙස මෙහෙයවීමට අධ්‍යාපනඥයින්ට නිසි පුහුණුවක් ලබා දීම සහ තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ කිරීම, ඉගෙනීම සහ සන්නිවේදනය සඳහා ඩිජිටල් ඉගෙනුම් වේදිකා භාවිතය පුහුණු කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන මෙම පර්යේෂකයෝ, තාක්ෂණය යනු වෙනස් වූ තත්ත්වයක් තුළ දැනුම බෙදා හැරීමේ සහ පන්ති පැවැත්වීමේ නව ක්‍රමය ලෙස පිළිගැනීමට අවශ්‍ය බව යෝජනා කරති. ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපනය තුළ නිර්මාණාත්මකබව සඳහා පූර්ණ ඉඩකඩ තිබිය යුතු බව ද, ඇල්ෆා සිසුන්ගේ අවධානය යොමු කිරීමේ පරාසය අවම වුවත් තීව්‍ර බැවින් ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා ගැටලු විසඳීම සහ විවේචනාත්මක චින්තන අංග, උගන්වනු ලබන විෂයයන්ට සම්බන්ධ කරන ලද නව ඉගෙනුම් ක්‍රම අවශ්‍ය බව ද ඔවුහු ප්‍රකාශ කරති (Soly et al., 2021). මෙම කරුණු ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපන සුසාධ්‍යකරන සැලසුම් සඳහා උපයෝගී වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් උපාංග සහ අන්තර්ජාලය, නව තාක්ෂණය භාවිතය සංවර්ධනය කිරීමෙහිලා ඉදිරිපත් කර ඇති පර්යේෂණ මත පදනම් වූ යෝජනා ඇල්ෆා පරම්පරාවේ අධ්‍යාපන සුසාධ්‍යකරන ගැටලු විසඳීමට උපයෝජනය කළ හැකිය.

ඵලදායී ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවලියක් සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම ඩිජිටල් තාක්ෂණය මත පදනම් නොවන බැවින්, ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ගගත ඉගැන්වීමේ සහ ඉගෙනුම් පිළිවෙත් ආධාරයෙන් 'මිශ්‍රිත ඉගෙනීම' ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙන නමුත් එය අභියෝගයක් බව Sanjeeva (2022) "ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය සමයේ අධ්‍යාපනයේ ඩිජිටල්කරණය" (Digitalization in education during COVID-19 pandemic in Sri Lanka) ආඛ්‍යාන විමර්ශනයේ ප්‍රකාශ කරයි. දුර්වල අන්තර්ජාල සම්බන්ධතා, දෙමාපියන්ගේ, සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ ඩිජිටල් තාක්ෂණික දැනුම් ඌනතාව සහ උපාංග හිඟකම, කාර්යක්ෂම සහ ගුණාත්මක

ඩිජිටල් උපාංග නොමැතිකම, ආර්ථික ගැටලු, අඩු ස්වයං-විනයවත්බව, යටිතල පහසුකම් සාධාරණ ලෙස බෙදී නොයෑම, සම්ප්‍රදායික විෂයමාලාව සමග නව ඉගෙනුම් සහ ඇගයුම් ක්‍රම සමග නොගැළපීම වැනි ගැටලු දක්නට ලැබෙන බව Sanjeeva (2022) පෙන්වා දෙයි. විශ්වවිද්‍යාල සහ රජය මැදිහත්වීමෙන් එම ගැටලු විසඳාගැනීමට හැකි බව ප්‍රකාශ කරන ඔහු, ඒ සඳහා පියවර ගැනීමට අවශ්‍ය බව ද පෙන්වා දෙයි (Sanjeeva, 2022).

"කොවිඩ්-19 අර්බුදය අතරතුර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ බලහත්කාරයෙන් හා සැලසුම් නොකළ ඩිජිටල් පරිවර්තනය: සිද්ධි අධ්‍යයනයක්" (Forced and unplanned digital transformation of education in Sri Lanka during Covid-19 crisis: A case study) (Rajaguru, 2021) පර්යේෂණයේ සහ, 'සිව්වන කාර්මිකරණ යුගයේ අධ්‍යාපනය දෙසට ඩිජිටල් පරිවර්තනය' (Digital transformation towards Education 4.0) (Oliveira & Souza, 2022) විමර්ශනයේ ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව, ප්‍රමිතීන් සහ ආචාර ධර්ම වැනි පවතින මූලික වටිනාකම්වලට හානියක් සිදු නොවන පරිදි ඩිජිටල්කරණයට උචිත ලෙස අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර ඇත.

විසි එක් වන සියවසේ සිවුවන කාර්මික විප්ලවයේ සාමාජිකයන් සඳහා ඉගෙනීම සහ වැඩ කිරීමට අවශ්‍ය මෘදු හා දෘඪ කුසලතා පුහුණු කිරීම සඳහා 'TADEO ක්‍රමය' යොදා ගත හැකි බවත්, එම ක්‍රමය මගින් මෙහෙයවනු ලබන ඉගැන්වීම් සහ ඉගෙනුම් අත්දැකීම් ඔස්සේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වූ බවත් Oliveira සහ Souza (2022) පෙන්වා දෙති. 'TADEO ක්‍රමය' අනුව කටයුතු කළ යුතු ආකාරය පහත පරිදි දක්වා ඇත.

- සිසුන්ගේ විශේෂතා සලකා බලා ඩිජිටල් තාක්ෂණය භාවිතය
- ගුරුවරුන් ඩිජිටල් කුසලතාවලින් සන්නද්ධ කිරීම
- විසි එක් වන වන සියවසේ ඉගෙනීමට සහ වැඩ කිරීමට අවශ්‍ය තාක්ෂණික, සංජානන, සමාජීය සහ චිත්තවේගීය කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීම
- අධ්‍යාපනික මෘදුකාංග නිර්මාණයට ප්‍රමුඛතාව ලබා දීම

- නායකත්වය සහ වෘත්තීය සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා දෘඪ කුසලතා සහ මෘදු කුසලතා සංයෝජනය සහ ප්‍රවේශ නිර්මාණය
- අධ්‍යාපන ආයතන ඩිජිටල් වෙනසට සුදුසු වන ලෙස සංවිධානය කිරීම
- අධ්‍යාපන ආයතන, දැනුම සම්ප්‍රේෂණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඉවත් වීම

අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සඳහා සාර්ථක ලෙස යොදා ගත් ධාවක Oliveira සහ Souza (2022) ඉදිරිපත් කර ඇත. තාක්ෂණික ධාවක (technological drivers), සංවිධානාත්මක ධාවක (organizational drivers), දෙමුහුන් ඉගැන්වීමේ ක්‍රම භාවිතය (hybrid teaching methods), ඩිජිටල් ඉගැන්වීමේ නිපුණතාව (digital teaching competence), ශිෂ්‍ය - ඩිජිටල් තාක්ෂණ නිර්මාණය (student - digital technologies design), ශික්ෂණ විද්‍යාව (pedagogy) එම ධාවක වේ. අධ්‍යාපනය නව්‍යකරණය කිරීමේ විධිමත් සැලැස්මක් ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. Oliveira සහ Souza (2022) සම්පත් සහ පහසුකම් ආශ්‍රිත ගැටලු බහුල සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනය හා සම්බන්ධ අභියෝගවලට මුහුණ දීම සඳහා අධ්‍යාපනය ඩිජිටල්කරණය විසඳුමක් විය හැකි බව ප්‍රකාශ කරති. එය එසේ වුවත්, Rajaguru (2021) සහ Sanjeeva (2022) ශ්‍රී ලංකාවේ සමස්ත පාසල් අධ්‍යාපන පද්ධතියම ඩිජිටල්කරණය කිරීම සඳහා පහසුකම් සහ යටිතල පහසුකම් නොමැතිකම ප්‍රධාන බාධාවක් බව ප්‍රකාශ කරති.

අධ්‍යාපනය සංවර්ධනයේදී අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ සහසම්බන්ධතාව ඇති කිරීම, දැනුම, ආකල්ප සංවර්ධනය අත්‍යවශ්‍ය බව Spasova (2022) "ඇල්ෆා පරම්පරාව සහ අධ්‍යාපනය" පර්යේෂණයේ අවධාරණය කරයි. විෂයමාලාව තුළ සම්ප්‍රදායික විෂයන් සමග ඩිජිටල් පරම්පරාවේ අවශ්‍යතා සපුරන නව විෂයන් ඇතුළත් කිරීම, පුද්ගලයන් ලෙස හැඩගැසීමට ඇල්ෆා සිසුන්ට උපකාර කිරීම අත්‍යවශ්‍ය බව Spasova (2022) පෙන්වා දී ඇත.

> ආච්චිලා සීයලා සමඟ අන්තර් ක්‍රියා කිරීම දිරිමත් කිරීම, දෙමාපියන් දරුවන්ට ඉගැන්වීමට උත්සාහ කරන සදාචාරාත්මක වටිනාකම් ආරක්ෂා කරනු ඇත. ගුරුවරුන් සහ අධ්‍යාපනඥයින් කුඩා දරුවන්ගේ ජීවිත තුළ අර්ථවත් හැඩගැස්වීමේ කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරන අතර, ඇල්ෆා පරම්පරාවට මනුෂ්‍යත්වය පවත්වා ගනිමින් මෙම නව ලෝකය තුළ ස්ථාපිත වීමට ඔවුන් දිගටම උපකාර කළ යුතුය (Spasova, 2022, පි. 68).

ඇල්ෆා පරපුර සමාජානුයෝජනය කිරීමේ දී අධ්‍යාපන පාර්ශ්වකරුවන්ට ඇති වගකීම සංවිධානය කළ යුතු ආකාරය මේ අනුව පැහැදිලි වේ.

"අංකිත ප්‍රාවේණිකයන් ලෙස ඇල්ෆා පරම්පරාවේ සිසුන්ගේ හැසිරීම සහ ඔවුන්ගේ ඉගෙනීමේ නිරත වීම" (Generation Alpha students' behavior as digital natives and their learning engagement) පර්යේෂණය ඔස්සේ Cimene සහ තවත් අය (2024) ඇල්ෆා සිසුන්ගේ විවිධ ඉගෙනුම් විලාසයන්ට ඉඩ සලසන සමබර ප්‍රවේශයක් නිර්මාණය කිරීම අවශ්‍ය බව සහ ශිෂ්‍ය ඉගෙනුම් ක්‍රම විෂමතා සලකා බලමින් ඒ අනුව උපදේශන උපාය මාර්ග සැලසුම් කිරීම කළ යුතු බව අනාවරණය කරයි. නම්‍යශීලී ඉගැන්වීමේ ක්‍රම සහ අඛණ්ඩ ගුරු පුහුණුව ප්‍රවර්ධනය අවශ්‍ය බව, ඉහළ ශිෂ්‍ය සහභාගීත්වයක් ඇති පහසුකම් සපයන්නා (facilitator), නියෝජිතයා (delegator) වැනි ඉගැන්වීමේ ශෛලීන් දිරිමත් කර ඉගැන්වීමේ උපාය මාර්ගවලට ඒකාබද්ධ කිරීම කළ යුතු බව පෙන්වා දෙයි.

"කියවීම එදිරිව තිර දර්ශන: ඇල්ෆා පරම්පරාවේ සංවර්ධනය" (Reading vs. Screening: The development of Generation Alpha) නිබන්ධනය මගින් Gibson (2024) සෞඛ්‍ය සම්පන්න මොළයේ වර්ධනය සඳහා කියවීමේ වැදගත්කම මෙන්ම අසීමිත තිර-කාලයක් ගත කිරීම නිසා ඇති විය හැකි අවාසි විශ්ලේෂණය කර ඇත. පර්යේෂකයා ඇල්ෆා පරම්පරාවේ ලක්ෂණ විග්‍රහ කරමින් ඔවුන් ඉගෙනගන්නා ආකාරය සහ ඔවුන්ගේ ප්‍රගතියට බලපාන සාධක මොනවාද යන්න පිළිබඳ මනස පිළිබඳ න්‍යාය (Theory of Mind), නිර්මාණාත්මක න්‍යාය (Constructivist Theory) සහ පාරිසරික න්‍යාය (Ecological Theory) යන න්‍යායන් ඔස්සේ විග්‍රහ කර ඇත. මනස පිළිබඳ න්‍යාය සංවේදනය සඳහා

ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. අන් අයගේ හැසිරීම් ආදර්ශනය කිරීම, අන් අයගේ හැඟීම් හඳුනා ගැනීම, ඔවුන්ට වෙනස් කැමැත්තක් සහ අකමැත්තක් ඇති බව තේරුම් ගැනීම, මිනිසුන් තමන්ගේම අවශ්‍යතා මත පදනම්ව ක්‍රියා කරන බව තේරුම් ගැනීම, ක්‍රියාවන්හි ප්‍රතිවිපාක හඳුනා ගැනීමේ කුසලතා සංවර්ධනය මෙයට අයත් වේ. නිර්මාණාත්මක න්‍යාය මගින් තහවුරු කරනු ලබන්නේ දරුවන් ඔවුන්ගේ පෙර අත්දැකීම් සහ අවබෝධය මත පදනම්ව නව දැනුම ලබා ගන්නා බවයි. සංජානන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ මාර්ගයක් ලෙස සමාජ අන්තර්ක්‍රියාවල වැදගත්කම මෙම න්‍යාය තුළ අවධාරණය කෙරේ. පාරිසරික න්‍යාය, සම්බන්ධතා පද්ධතියක් ලෙස සලකයි. මෙය පවුල් වටිනාකම් සහ පාසලේ සිට සමාජය දක්වා සංස්කෘතික වටිනාකම්, නීති සහ සිරිත් විරිත් දක්වා විහිදේ. පවුල් ජීවිතයට සංස්කෘතික හා සමාජීය සාධක සමඟ අපගේ පෞරුෂ වර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ආකාරය Gibson (2024) පැහැදිලි කරයි. අහිතකර සංවර්ධන ප්‍රමාදයන්, අවධානය යොමු කිරීමේ ඌනතා, ක්‍රීඩා ආබාධ, අධික තිර- කාලයක් ගත කිරීම නිසා ඇති විය හැකි හානි ලෙස පෙන්වා දෙන අතර, ඇල්ෆා පරම්පරාවේ සෞඛ්‍ය සම්පන්න සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ ක්‍රම දෙමාපියන්ට සහ භාරකරුවන්ට ලබා දීම අවශ්‍ය බව ඔහු දක්වා ඇත (Gibson, 2024).

ඩිජිටල් පරතරයට මුහුණ දීමට ගුරුවරු පුහුණු කිරීම අවශ්‍ය බවත් විෂයමාලාව වෙනස් විය යුතු බවත් පෙන්වා දෙන Höfrová සහ තවත් අය (2024) අනාගත වෘත්තීන් දියුණු තාක්ෂණය සහ කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ වන බැවින් අංකිත ක්‍රීඩාකරණය (Digital Gamification) අධ්‍යාපනයට එකතු කළ යුතු බවට යෝජනා කරයි. Huss සහ Eastep (2024) සහ Rahim සහ තවත් අය (2024) තම පර්යේෂණ තුළින් පෙන්වා දෙන්නේ උපක්‍රමශීලී ලෙස මාධ්‍ය භාවිතය අධ්‍යාපනය කරා යොමු කිරීමත්, තිර කාලය අවම කිරීමට අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කිරීමත් අවශ්‍ය බවය.

"ඇල්ෆා පරම්පරාවට අධ්‍යාපනය ලබා දීම සඳහා ක්‍රීඩාකරණය සහ ක්‍රීඩාව පදනම් කරගත් ඉගෙනුම් භාවිතය: ක්‍රමානුකූල සාහිත්‍ය විමර්ශනයක්" (Use of gamification and game-based learning in educating Generation Alpha: A systematic literature review) පර්යේෂණය මගින් Fernando සහ

Premadasa (2024) ඇල්ෆා පරම්පරාවේ ගති ලක්ෂණ ආමන්ත්‍රණය කිරීමට සුදුසු ක්‍රීඩාකරණ ඉගෙනුම් ක්‍රම සැලැස්මක් සිතියම්ගත කිරීමට යෝජනා කරයි. අධ්‍යාපනික ක්‍රීඩාකරණය සහ ක්‍රීඩාව පදනම් කරගත් ඉගෙනුම් (Game-based learning - GBL) යෙදුම් ගෝලීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ජනප්‍රිය බවත්, ක්‍රීඩාකරණ ශිල්පීය ක්‍රම (gamification techniques) සහ උපාය මාර්ග ඇල්ෆා සිසුන්ගේ හැසිරීම් ලක්ෂණවලට වඩාත් ගැළපෙන බවත් එම පර්යේෂණය මගින් අනාවරණය කෙරේ. ක්‍රීඩා අංග කිහිපයක් ඒකාබද්ධ කිරීම, පාසල් ගුරුවරුන්ට ඩිජිටල් ක්‍රීඩාකරණය කළ ඉගෙනුම් පරිසර තුළ ක්‍රියා කිරීමේ කුසලතා සහ දැනුම ලබා දීම අවශ්‍ය බව අවධාරණය කරයි. තවද, ඇල්ෆා පරම්පරාවෙහි යථාර්ථවාදී ඉගෙනුම් මනාප විමර්ශනය කිරීම, නව අධ්‍යාපනික ක්‍රීඩා සංරචක, අනුවර්තනය කළ හැකි ක්‍රීඩාකරණීය ඉගෙනුම් උපාය මාර්ග (adaptive gamification learning strategies) සැලසුම් කිරීමේ අවශ්‍යතාව සහ නව අධ්‍යාපන ක්‍රම සම්බන්ධ අනාගත පර්යේෂණ අවශ්‍ය බව නිර්දේශ කරයි (Fernando & Premadasa, 2024) .

උක්ත සඳහන් ඇල්ෆා සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ ගැටලු සහ ඉදිරිපත් කර ඇති යෝජනා ධනාත්මක දෘෂ්ටිකෝණයකින් යුක්තව සැලසුම් කිරීමෙන් මෙරටට ආදේශ කිරීමට හැකියාව පවතී.

**ශ්‍රී ලංකාවේ ඇල්ෆා පරම්පරාවේ සංජානන හා පිළිගැනීම**

ශ්‍රී ලංකාවේ ඇල්ෆා දරුවන් තුළ ඇති කුසලතා බලගැන්වීම සඳහා ඇති බාධක හඳුනාගනිමින් ඔවුන්ගේ දුර්වලතා අවම කිරීමට හැකි, සුව පහසු කලාපයක් තුළ තම අනන්‍යතාව අනුව ජීවත් විය හැකි යහපත් මානසික සෞඛ්‍යයක් හිමි පුරවැසියෙකු නිර්මාණය කිරීමට සුදුසු අධ්‍යාපන රටාවක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා පර්යේෂණ මත පදනම් වූ දත්ත පදනම් කරගනිමින් යෝජනා සම්පාදනය කළ යුතු වේ. වෙනස සඳහා බිය වීම, වර්තමාන ප්‍රත්‍යක්ෂය මත පමණක් පදනම්ව වෙනස ප්‍රතික්ෂේප කිරීම, ආර්ථික සහ කළමනාකරණ දුර්වලතා මෙරට විද්‍යමාන අභියෝග බව පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයෙන් හඳුනා ගැනීමට හැකි වේ.

බණ්ඩාර (2007), "සංඛ්‍යාත ජන සන්නිවේදන මාධ්‍ය තාක්ෂණය පාදක වෙමින් නිර්මාණය වන ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික ගතිකත්වයන්හි ස්වරූපය පිළිබඳ විමසීමක්" නිබන්ධනයේ 2007 වර්ෂයේ ඉදිරිපත් කර ඇති භවිෂ්‍ය කථනය (forecasting) 2026 වන විට යථාවක් බවට පරිවර්තනය වී ඇති ආකාරය දැක ගත හැකිය. තිර මාධ්‍ය පදනම්කොට ගත් පහත සඳහන් සංස්කෘතීන් අනාගතයේ බිහිවන බව පර්යේෂකයා පෙන්වා දී ඇත (බණ්ඩාර, 2007).

- "බ්ලිප් සංස්කෘතිය" (Blip Culture) - තිර මාධ්‍ය පදනම් කරගෙන ගොඩනැගුණ සංස්කෘතික ප්‍රවේශයකි. යථාව සහ අතථ්‍යාව අතර දෝලනය වන තොරතුරු තිර මාධ්‍ය ඔස්සේ ලබා දීම සිදු වේ. මෙම සංස්කෘතිය තුළ මිනිසා දෘශ්‍ය නැවුම් බැවින් ඉවත්වන අතර හුදකලා අවකාශය තොරතුරු සන්නිවේදනය කරන අතිශය පුද්ගලබද්ධ මිනිසෙකු බිහි කරන බව පෙන්වා දෙයි.

- "සංවේද්‍ය සංස්කෘතිය" (Sensate Culture) - තිර පදනම් කොට ගෙන හිස් ආත්ම සන්ද්‍රවයකින් (Empty Self Syndrome) යුත් ජනතාවක් බිහිවෙන බව පෙන්වා දී ඇත.

- "පරිගණක පාදක ක්‍රීඩා" (Computer-based Games) - පරිගණක ක්‍රීඩා මගින් ගැඹුරු විඥානයේ පවතින ආශාවන් ඉටු කර ගැනීමට හැකි බැවින් එයට මිනිසුන් ඇබ්බැහි වන බවත්, ආකර්ෂණීය අතථ්‍ය, ව්‍යාජ යථාර්ථ ලොවක් සමග මිනිසා ගනුදෙනු කරන බවත්, මෙයින් මිනිසා හුදකලා කරන බවත් පර්යේෂකයා ප්‍රකාශ කරයි.

- "තොරතුරු සමාජ" (Information Societies) - තාක්ෂණය සමග තොරතුරු විචිත්‍ර ස්වභාවයක් ගන්නා බවත්, තොරතුරු අතිරික්තයක් බිහි කරන බවත්, අතථ්‍ය හෝ යථාර්තවාදී නොවන "අතථ්‍යරූපී යථාර්තය" (Hyper Reality) ඇති කරන බවත් පෙන්වා දෙයි.

මෙම පර්යේෂණයේ අනාගතයේ තොරතුරු තාක්ෂණය සහ තිර භාවිතය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙන් වෙන් කළ නොහැකි බව ප්‍රකාශ කර ඇත. බණ්ඩාර (2007) පර්යේෂණය, වෙනස සඳහා බිය නොවිය යුතු බවත්, ගෝලීය බලපෑමෙන් මිදීමට අවකාශ නොමැති බවත් පෙන්වා දෙයි.

පාසල් අධ්‍යාපනය තුළ ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රාථමික පාසලක් මුහුණ දෙන අභියෝග විමර්ශනය උදෙසා Rajaguru (2021) විසින් සිදු කළ "කොවිඩ්-19 අර්බුදය අතරතුර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ බලහත්කාරයෙන් හා සැලසුම් නොකළ ඩිජිටල් පරිවර්තනය: සිද්ධි අධ්‍යයනයක්" (Forced and unplanned digital transformation of education in Sri Lanka during Covid-19 Crisis: A case study) පර්යේෂණයේ ඩිජිටල් ඉගැන්වීම් සිදු කිරීමේදී පාසල මුහුණ දෙන අභියෝග ලෙස; ඩිජිටල් සාක්ෂරතාවයේ දුර්වල මට්ටම, දුර්වල තාක්‍ෂණික යටිතල පහසුකම්, අන්තර්ජාල සේවාවන් නොමැතිකම, ඩිජිටල්කරණයට නොගැළපෙන යාවත්කාලීන නොවූ අධ්‍යාපනය, ආර්ථික ගැටලු දක්වා ඇත. අනෙකුත් කර්මාන්ත, ප්‍රදේශ සමග සසඳන විට අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය මන්දගාමී බව පෙන්වා දෙන පර්යේෂකයා අධ්‍යාපන පද්ධතිය සඳහා ඩිජිටල් මාර්ග සිතියම සැලසුම් කිරීමට යෝජනා කරයි (Rajaguru, 2021).

"ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය සමයේ අධ්‍යාපනයේ ඩිජිටල්කරණය" (Digitalization in education during COVID-19 pandemic in Sri Lanka) ආඛ්‍යාන විමර්ශනය ඔස්සේ Sanjeeva (2022) විසින් මාර්ගගත අධ්‍යාපනයේ හදිසි මතුවීම සහ ඉන් මතුවූ ගැටලු විමර්ශනය කෙර්. දුර්වල අන්තර්ජාල සම්බන්ධතාව, දෙමාපියන්ගේ, සිසුන්ගේ ඩිජිටල් තාක්ෂණ භාවිතය පිළිබඳ දුර්වල සාක්ෂරතාව, ගුණාත්මක ඩිජිටල් උපාංග නොමැතිකම සහ ආර්ථික ගැටලු මාර්ගගත අධ්‍යාපනය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු සහ විසඳිය යුතු ගැටලු බව ඔහු පෙන්වා දෙයි (Sanjeeva, 2022).

අධ්‍යාපන නව්‍යකරණය පිළිබඳ අවධානය යොමු කිරීමේදී බණ්ඩාරනායක (2018) ප්‍රකාශිත තත්ත්වය තවමත් වෙනසක් නොවී ඇති ආකාරයක් Sanjeeva (2022) විමර්ශනයේදී දක්නට ලැබේ. තාක්ෂණය අධ්‍යාපනය සඳහා උපයෝගී කර ගැනීමේදී ඵලදායී ඉගෙනුම් පරිසරයක් පවත්වා ගැනීම සඳහා සිසුන්ට ස්වයං විනය අවශ්‍ය බව Sanjeeva (2022) පෙන්වා දෙයි. අධ්‍යාපනය සංවර්ධනයේදී තාක්ෂණික මෙවලම් සහ අන්තර්ජාලය භාවිතයට ගන්නේනම් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති සකස් කිරීම අවශ්‍ය බව පර්යේෂකයා පෙන්වා දෙයි.

මේ අනුව පැහැදිලි වන්නේ ඇල්ෆා සිසුන් වෙනුවෙන් ගොඩනැංවෙන ඉගෙනුම් සුසාධ්‍යකරණ ක්‍රමෝපාය තුළ තාක්ෂණය භාවිතයට පාලනයක් යටතේ ඉඩ දීම අනිවාර්ය බවය. එහි ප්‍රමාණය කුමක්ද? සිදු කරන්නේ කෙසේද? යන්න හඳුනා ගත යුතුව ඇත. අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ ධනාත්මක මැදිහත්වීම සංවිධානය කරන්නේ කෙසේද? අධ්‍යාපන පද්ධතියේ මානව සම්පත් තුළ නව තාක්ෂණය පිළිබඳ දැනුම සහ කුසලතා සංවර්ධනය කරන්නේ කෙසේද? මෘදුකාංග සහ දෘඩාංග සම්පාදනය කරගන්නේ කෙසේද? යනාදී කරුණු පිළිබඳ අනාගත පර්යේෂණ අනාගත අධ්‍යාපන පද්ධතිය පෝෂණය කිරීමට අවශ්‍ය වේ.

## නිගමන

මෙම ආඛ්‍යාන සාහිත්‍ය විමර්ශනය මගින් 2010න් පසු උපන් ඇල්ෆා පරම්පරාවේ මනෝ-සමාජීය චර්යා රටා, ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමේදී මුහුණ දෙන අභියෝග, එම අභියෝග ජය ගැනීමේ ක්‍රමෝපායන්, අධ්‍යාපන පාර්ශ්වකරුවන්ගේ භූමිකා, ශ්‍රී ලංකාවේ ඇල්ෆා පරපුර උදෙසා අධ්‍යාපන ක්‍රමෝපාය සැලසුම් පිළිබඳ විශ්ලේෂණය කරයි. ඇල්ෆා පරම්පරාව ඉහළ ඩිජිටල් සාක්ෂරතාවකින් යුතු, අතථ්‍ය තාක්ෂණයන් සමග සහජ සන්නිවේදනයක් පවත්වන පිරිසක් වුවත්, කෙටි අවධානය, ජීවන කුසලතා හිඟකම, හුදකලා බව සහ මානසික බිඳෙනසුලු බව වැනි සුවිශේෂී මනෝ-සමාජීය අභියෝග පවතී. එම නිසා ඔවුන්ගේ සංජානන සහ චිත්තවේගීය අවශ්‍යතාවලට ගැලපෙන, අතථ්‍ය හෝ සුතථ්‍ය අධ්‍යාපනයේ අන්තවාදී නොවූ සුසමාදර්ශී අධ්‍යාපන වෙනසක් අවශ්‍ය බව නිගමනය කළ හැකිය. තාක්ෂණික පරිවර්තනයේදී ගුරුවරුන් සාම්ප්‍රදායික ඉගැන්වීමෙන් මිදී, අතථ්‍ය සහ සුහුරු පන්තිකාමර මෙහෙයවීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා ගනිමින්, පහසුකම් සපයන්නෙකු ලෙස පරිවර්තනය විය යුතු වේ. පාසල් පරිපාලනය සම්ප්‍රදායික අධිකාරීවාදී නීතිරීති වෙනුවට ඇල්ෆා සිසුන්ගේ ස්වාධීනත්වය, අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව අගය කරන, සංවාදය සහ සම්මුතිය මත පදනම් වූ පරිවර්තනීය නායකත්වය මගින් පාසල් පරිසරය නැවත සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ඇල්ෆා දරුවන් තාක්ෂණයෙන් සම්පූර්ණයෙන් විතැන් කරවීම වෙනුවට සුපරීක්ෂාකාරී අධීක්ෂණය මගින් අධික තිර-කාලය පාලනය කිරීම, දරුවන්ට

ආත්ම විශ්වාසය ලබා දීම, සමාජ-චිත්තවේගීය ඉගෙනුම තුළින් චරිත සංවර්ධනය හා මානසික සෞඛ්‍යයට සහය වීම සඳහා සමීප දෙමාපිය මැදිහත්වීම අවශ්‍ය වේ. ඇල්ෆා සිසුන්ට අවශ්‍ය කුසලතා පෝෂණය කිරීම සඳහා මිශ්‍රිත ඉගෙනුම, ක්‍රීඩාකරණය, විවේචනාත්මක චින්තනය, සන්නිවේදනය, සහයෝගීතාව, නිර්මාණශීලීත්ව කුසලතා, සහ සමාජ-චිත්තවේගීය ඉගෙනුම් ආකෘති අධ්‍යාපනයට ඒකාබද්ධ කළ යුතුවේ. ශ්‍රී ලංකාව මුහුණ දෙන යටිතල පහසුකම් ඌනතාව සහ ආර්ථික බාධක හමුවේ වුවද, ඩිජිටල් තාක්ෂණය පාලනයක් සහ විනයක් සහිතව අධ්‍යාපනයට එකතු කර ගන්නා ජාතික ඩිජිටල් මාර්ග සිතියමක් සකස් කිරීම මගින් ඇල්ෆා පරම්පරාව අනාගත ලෝකයට සාර්ථකව සූදානම් කළ හැකිය.

## About the authors

**Ms N.R.T.N.K. Rathnayake** is a Grade I Graduate Teacher at Sri Dharmaloka College, Kelaniya, with over 20 years of teaching experience. She holds a BA, PGDip, and MEd, and is currently an MPhil candidate at the University of Kelaniya. Her research interests include pedagogy and innovative instructional methodologies.

**Dr. C. Siriwardena** is a Senior Lecturer at the University of Kelaniya, holding a PhD in Philosophy alongside extensive experience in teaching, research, and consultancy. Possessing the academic expertise required to lead and inspire scholarly pursuits, she is dedicated to advancing knowledge through rigorous research and professional practice. Furthermore, she is committed to fostering critical thinking and making a meaningful contribution within a multidisciplinary context.

**Disclosure statement**: No potential conflict of interest was reported by the authors.

## ආශ්‍රිත ග්‍රන්ථ

බණ්ඩාර, ඩබ්ලිව්. ජී. කේ. එස්. (2007). *සංඛ්‍යාත ජන සන්නිවේදන මාධ්‍ය තාක්ෂණය පාදක වෙමින් නිර්මාණය වන ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික ගතිකත්වයන්හි ස්වරූපය පිළිබඳ විමසීමක්* [අප්‍රකාශිත විශේෂවේදී උපාධි නිබන්ධනය]. කොළඹ විශ්වවිද්‍යාලය.

*Generation, Alpha Generation, Education Stakeholders, Education Strategy, Digital Learning*


බණ්ඩාරනායක, ආර්. ඩබ්ලිව්. බී. එම්. ඩී. එම්. (2018). ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසල් තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානයේ භාවිතය. *ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව*, *15*, 64-83.

Akmal, Y., Koeswantono, S., Hartati, S., & Hikmah. (2020). Character development in Generation Alpha through social-emotional learning with parent involvement. In *Proceedings of the 1st International Conference on Early Childhood Care Education and Parenting (ICECCEP 2019)* (pp. 41-47). Atlantis Press. https://doi.org/10.2991/assehr.k.201205.091

Arifah, M. N., Munir, M. A., & Nudin, B. (2021). Educational design for Alpha generation in the Industrial Age 4.0. *Advances in Economics, Business and Management Research*, *168*, 137–145. https://doi.org/10.2991/aebmr.k.210305.026

Britannica Dictionary. (2026, January 7). Generation. In *Britannica.com*. https://www.britannica.com/dictionary/Generation

Cetin, M., & Halisdemir,M. (2019). School Administrators and Generation Z Students' Perspectives for a Better Educational Setting. *Journal of Education and Training Studies*. 7(*2*), p.84-97. https://files.eric.ed.gov/fulltext/EJ1202111.pdf

Cimene, F. T. A., Mamburao, M. L., Plaza, Q. B., Nitcha, H. Q., Somalipao, M., Raña, E. J. M., Baseo, E. S., Siao, Q. E. A., Mauna, A. A., & Cimene, D. R. A. (2024). Generation Alpha students' behavior as digital natives and their learning engagement. *Psychology And Education: A Multidisciplinary Journal*, *27*(2), 258–273. https://doi.org/10.5281/zenodo.14007254

Fernando, P. A., & Premadasa, H. K. S. (2024). Use of gamification and game-based learning in educating Generation Alpha: A systematic literature review. *Educational Technology & Society*, *27*(2), 114-132. https://doi.org/10.30191/ETS.202404_27(2).RP03

Gibson, F. (2024). *Reading vs screening: The development of Generation Alpha* [Honors thesis, Regis University]. ePublications. https://epublications.regis.edu/theses

Höfrová, A., Balidemaj, V., & Small, M. A. (2024). A systematic literature review of education for Generation Alpha. *Discover Education*, *3*(1), 125. https://doi.org/10.1007/s44217-024-00218-3

Huss, J., & Eastep, S. (2024). A Tri-State Study of Middle School Teachers' Perceptions of Generation Alpha Students: Are Middle Schools Ready for "Generation Glass?" *I.e.: Inquiry in Education*, *16*(1). https://digitalcommons.nl.edu/ie/vol16/iss1/7

Jha, A. K. (2020). *Understanding Generation Alpha*. https://doi.org/10.31219/osf.io/d2e8g

Jaiswal, R. (2023). HR strategies for generation Alpha: What would it look like? *International Journal of Creative Research Thoughts, 11*(7), 592–598. https://www.ijcrt.org/papers/IJCRT2307301.pdf

Karthikeyan, C. (2022). Exploring Generation Alpha with an HR perspective. *Journal of Emerging Technologies and Innovative Research, 9*(7), 749–760. https://www.jetir.org/papers/JETIR2207192.pdf

Karomi, A. D., & Mamlukhah, M. (2025). Transformational Leadership in Changing the Education Paradigm: Improving the Quality of Alpha Generation Student. *JMKSP*

*(Jurnal Manajemen, Kepemimpinan, Dan Supervisi Pendidikan)*, *10*(1), 188–201. https://doi.org/10.31851/jmksp.v10i1.17723

McCrindle M., & Fell, A. (2020). Understanding Generation Alpha. *McCrindle Research Pty Ltd*. https://www.researchgate.net/publication/342803353

Novianti, R., Hukmi, H., & Maria, I. (2019). The role of parents in assisting the use of gadget in alpha generation. *Proceedings of the UR International Conference on Educational Sciences*, 258–262. https://www.academia.edu/80235322/The_Role_of_Parents_in_Assisting_the_Use_of_Gadget_in_Alpha_Generation

Oliveira, K. K. D. S., & De Souza, R. A. C. (2021). Digital transformation towards Education 4.0. *Informatics in Education*. https://doi.org/10.15388/infedu.2022.13

Ouadoud, M., Rida, N., & Chafiq, T. (2021). Overview of E-learning Platforms for Teaching and Learning. *International Journal of Recent Contributions from Engineering, Science & IT (iJES)*, *9*(1), 50. https://doi.org/10.3991/ijes.v9i1.21111

Rahim, M., Ahmed, S., Tobawal , M. U., Wazir, S., & Persian, L. (2024). Investigating parental involvement in Alpha Generation’s digital activities. *Migration Letters*, *21*(S12), 281–289. https://migrationletters.com/index.php/ml/article/view/11508

Rajaguru, S. (2021). *Forced and unplanned digital transformation of education in Sri Lanka during Covid-19 Crisis: A case study*. https://doi.org/10.13140/RG.2.2.36758.06722

Reis, T. A., Carneir, C. G., Bezerra, F.D., Oste, G., & Cremonezi, C. (2018). Study on The Alpha Generation And The Reflections of Its Behavior in the Organizational Environment. *Quest Journals Journal of Research in Humanities and Social*

*Science*. *6*(*1*), 9-19. https://www.questjournals.org/jrhss/papers/vol6-issue1/C610919.pdf

Sanjeeva, K. P. P. (2022). *Digitalization in education during COVID-19 pandemic in Sri Lanka. In Transforming the teaching-learning process during the pandemic* (pp. 63–68). Staff Development Center, Wayamba University of Sri Lanka. https://www.researchgate.net/publication/365318421

Soly, N., Benny, K., & Thomas, M. R. (2021). Technological perspectives of education for Generation Z and Generation Alpha. *Utkal Historical Research Journal, 34*(3), 153–169. https://www.researchgate.net/publication/353345012

Spasova, D. (2022). Generation Alpha and the education. In *X International Scientific Conference 2022: Technics, technologies, education, safety* (Vol. 1, pp. 65–68). Scientific-Technical Union of Mechanical Engineering "Vasil Levski." https://www.researchgate.net/publication/361484866

Yurtseven, N., & Karadeniz, Ş. (2020). An overview of Generation Alpha. In N. Yurtseven (Ed.), *The teacher of Generation Alpha* (pp. 11–31). Peter Lang GmbH, Internationaler Verlag der Wissenschaften. https://doi.org/10.3726/b16823